*සැ. යු.*- 2014.08.15 දින පළ වූ අංක 1,876 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,877 - 2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2014.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1456 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1458 |


*සැ. යු.*- මහ නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. ඩී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1453- B 80867—2,875 (2014/08)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශක තනතුරුවලට පත් කිරීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ 3 සේවා ගණයේ I වන ශ්‍රේණියේ ශිල්ප ප්‍රදර්ශක තනතුර දරන සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාලයන්හි පවතින පුරප්පාඩු සඳහා එම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය (ශිල්ප ප්‍රදර්ශක) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධාන ප්‍රකාරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සඳහා පත් කිරීම් සිදු කරනු ලැබේ.

| *සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. තනතුරට අදාලව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| 3. තනතුරට අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති අතිරේක පළපුරුද්ද | 35 |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 |
| | 100 |

02. *අයදුම් කිරීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පෞද්ගලිකවම සකස් කර තම ආයතන ප්‍රධානියාගේ සහතිකය සහිතව 2014.09.22 දිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඔල්කොට් මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත්‍ර එවනු ලබන කවරයේ වම්පස ඉහළින් "කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශක තනතුර" ලෙස සඳහන් කළ යුතුය.

03. *තනතුරට අදාළ වැටුප :-*

මෙම තනතුරට අදාල මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 20,030 - 11 x 365 - 18 x 500 - 33,045 වේ. MN-7-2006 (ඒ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. *පුරප්පාඩු සංඛ්‍යාව :-*

තාක්ෂණ විද්‍යාලයන්හි පුරප්පාඩු 09 ක් හා කාර්මික විද්‍යාලයන්හි පුරප්පාඩු 29 ක් මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ඇත.

05. *සුදුසුකම් :*

(i) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුරේ I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) අයදුම්පත් කැඳවීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබිය යුතුය.

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ 3 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුරේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබිය යුතුය.

(iv) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබිය යුතුය.

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *තෝරා ගැනීමේ ක්‍රමය :-*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු මත සැකසෙන කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි තාක්ෂණ විද්‍යාලයක හෝ කාර්මික විද්‍යාලයක සේවය කිරීමට සූදානම් විය යුතුය. අනුයුක්ත කරන විද්‍යාලයේ පත්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ පත්වීම අවලංගු කර ඊළඟට සුදුසුකම් ලබන අයවළුන් පිළිවෙළින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

07. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නියමයන්ට ද එම පටිපාටියෙහි දැනටමත් කර ඇති හා මතුවටත් කරනු ලබන සංශෝධනවලට ද යටත්ව මෙම පත්වීම් කරනු ලැබේ.

08. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමටද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

09. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශක තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පරිපාටිය

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු* |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>1. වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 10<br>2. සහතික පත්‍ර පාඨමාලා (මාස 06 ට නොඅඩු) ලකුණු 07<br>3. සහතික පත්‍ර පාඨමාලා (මාස 06 ට අඩු) එම සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 08 | 25 |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම් (බඳවා ගැනීමට අදාළ කර ගන්නා ලද සුදුසුකම් හැර)<br>1. වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලද අදාල ක්ෂේත්‍රයේ NVQ 7 මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම සඳහා ලකුණු 20<br>2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ NVQ 6 මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම සඳහා ලකුණු 15 | 35 |
| 03. අතිරේක පළපුරුද්ද<br>1. ශිල්ප ප්‍රදර්ශක තනතුරේ I ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ඉක්මවන වර්ෂයක් සඳහා වසරකට ලකුණු 05 බැගින් (උපරිම ලකුණු 35)<br>04. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය සඳහා | 35<br><br>05 |
| එකතුව | 100 |

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තියේ ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම්පත**

1. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   1.2 සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

2. 2.1 ලිපිනය :————.
   2.2 දුරකථන අංකය :————.
   2.3 සේවා ස්ථානය :————.

3. 3.1 උපන් දිනය
   අවුරුද්ද :————.මාසය :————. දිනය :————.
   3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස
   අවුරුදු :————. මාස :————. දින :————.

4. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

5. 5.1 ශිල්ප ප්‍රදර්ශක තනතුරට බඳවා ගත් ශ්‍රේණිය හා දිනය :————.
   5.2 I පන්තියට උසස්වීම් ලැබූ දිනය :————.
   5.3 I පන්තියේ සේවා කාලය :————.
   5.4 ශිල්ප ප්‍රදර්ශක තනතුරට බඳවා ගත් භාෂා මාධ්‍යය :————.

6. 6.1 කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ 3 සේවා ගණයේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබේ ද? :————.
   6.2 එසේ අන්තර්ග්‍රහණය කර ඇත්නම් කවදා සිට ද? :————.

7. 7.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු ගණන :————.
   7.2 ශිල්ප ප්‍රදර්ශක තනතුරේ I වන ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය :————.

අයදුම්පත්‍රය භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 5 තුළ ලැබිය යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් එම කාලය තුළ කවර ආකාරයක හෝ කිසිදු විනයානුකුල දඬුවමක් ලබා නැති බවත් ප්‍රකාශ කරමි. මෙම තනතුරට අවශ්‍ය සුදුසුකම් මා විසින් සපුරා ඇති බවත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත් අසත්‍ය බව හෙළිවුවහොත් තෝරා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අනුව මා තෝරා ගත්ත ද පත්වීම් ලැබීමට නුසුදුස්සකු වන බව දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ……………… මයා ……………… දින සිට මෙම කාර්යාලයේ සේවය කර ඇති බවත්,.. ……… දිනට පූර්වයෙන් වූ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් සියළු කරුණු මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන්, මා පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්.……… දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

08-718

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලය, දක්‍ෂිණ මණ්ඩපය - සූරියවැව උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරි තනතුරු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය, දක්‍ෂිණ මණ්ඩපය, උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරි තනතුරු සඳහා 2014 ජූලි මස 27 වැනි දින සිට 2014 අගෝස්තු මස 31 වැනි දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිමකිරීමට සමත්වන කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරි තනතුරුවලට අදාල උපාධි පාඨමාලාවන් අතුරින් වාස්තුවිද්‍යාවේදී උපාධිය අවුරුදු පහක් ද (අවු. 05), විද්‍යාවේදී (බී. එස්. සී) (නිර්මිත පරිසරය) (ගෞරව) උපාධි පාඨමාලාව අවුරුදු හතරක් ද (අවු. 04), විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) උපාධි පාඨමාලාව අවුරුදු තුනක්ද (අවු. 03), විද්‍යාවේදී) (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව අවුරුදු හතරකි (අවු. 04), විද්‍යාවේදී (බී. එස්. සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව කාලසීමාව අවුරුදු හතරකි. (අවු 04), විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු තාක්‍ෂණ උපාධි පාඨමාලාව අවුරුදු හතරකි. (අවු. 04) සහ විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව අවුරුදු හතරක් ද (අවු. 04) වේ.

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන් හා නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරාගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්‍ෂණවලදී අපේක්‍ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොටගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරිලත් තනතුරු සඳහා පත් කරනු ලැබේ.

3.2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුනට අදාළ පරිදි වාස්තු විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) (ගෞරව) උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු තාක්‍ෂණ උපාධිය හෝ විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු පද්ධති උපාධිය පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්‍ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතු ය.

(අ). *වාස්තුවිද්‍යාවේදී උපාධිය.*—කාලසීමාව අවුරුදු පහකි. (අවු.05).

විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි. (අවු. 04)
විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනකි. (අවු. 03)

2013 හෝ 2012 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(i) අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක්

ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

සහ

(ii) පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක්

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය | |

(iii) අවම වශයෙන් අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය I හෝ II විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම.

(ආ) විද්‍යාවේදී (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි. (අවු. 04)

2013 හෝ 2012 වර්ෂයේදී අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයකට ද :

සංයුක්ත ගණිතය උසස් ගණිතය
සහ

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය/විෂයන්ට ද පෙනී සිටියා විය යුතුය.

ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය ව්‍යාපාර අධ්‍යයනය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය.

ඊට අමතරව අපේක්‍ෂකයන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

(අ) ගණිතය I හෝ II විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්,
(ආ) විද්‍යා I හෝ III විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්,
(ඇ) ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්.

(ඇ) *විද්‍යාවේදී (බී. එස්. සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි. (අවු 04)*

2013 හෝ 2012 වර්ෂයේ දී අ. පො. ස. (උ./පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ වෙනත් ඕනෑම අනුමත විෂයයක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ඇ) විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු තාක්‍ෂණ උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි. (අවු. 4)

2013 හෝ 2012 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ගණිත, ජීව විද්‍යා, කලා සහ වාණිජ විෂය ධාරාවන් අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ඉ) විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි (අවු. 4)

2013 හෝ 2012 වර්ෂයේ දී අ. පො. ස. (උ. /පෙළ) විභාගයෙන් ගණිත, ජීව විද්‍යා, කලා සහ වාණිජ විෂය ධාරාවන් අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

3.5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාල වන පරිදි ඉංග්‍රීසි, කළමනාකරණය, නීතිය, අන්තර්ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන් ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතු ය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව හා නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතු ය.

04. *කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*
අයදුම්කරු.—

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ආ) 2014 අගෝස්තු මස 31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතු යි.

*අධ්‍යාපන සුදුසුකම් :*

(ඇ) අ. පො. ස. (උ/පෙළ) විභාගයෙන් අදාල විෂයය ධාරාවෙන්, විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 3ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් (Yes) සපුරා තිබීම ; සහ

(i) සාමාන්‍ය පොදු පරීක්‍ෂණයෙන් සමත්වීම;
(ii) අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

(ඈ) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතු ය.

| | | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| උස : | යුද හමුදාව | - 5' 6" | 5' 3" |
| | නාවික හමුදාව | - 5' 6" | 5' 3" |
| | ගුවන් හමුදාව | - 5' 6" | 5' 4" |
| බර : | යුද හමුදාව | කිලෝ ග්‍රෑම් 50 | — |
| | නාවික හමුදාව | කිලෝ ග්‍රෑම් 50 | කිලෝ 41 |
| | ගුවන් හමුදාව | 17<BMI<26 | 17<BMI<25 |
| පපුව : | | 32" (ප්‍රශ්වාස) | — |

*සටහන.*—ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන් හි සුවිශේෂ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු අතර, පෙර කී අවශ්‍යතාවයන්ට අමතරව ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්‍ෂණයකින් ද සමත් විය යුතුයි.

(ඊ) අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරියෙකුට/නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළ දී විවාහ වීමට අවසර නොමැති අතර, සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. *සේවා කොන්දේසි.*—තෝරාගනු ලබන අපේක්‍ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපයේ - සූරියවැව උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ට ද අනුකූලව පනවන ලද්දා වූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්‍ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාල උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට

අදාලවන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/නිලධාරිනියකට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකුගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 26,000 ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද නොමිලේ සපයනු ලැබේ.

(i) ආහාර හා නවාතැන්
(ii) නිල ඇඳුම්
(iii) අනුගාමික සේවාවන්
(iv) ක්‍රීඩා හා විනෝද පහසුකම්
(v) වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

(අ) පහත සඳහන් මාසික දීමනාවන් ද ගෙවනු ලැබේ :–
(i) සුදුසුකම් දීමනා;
(ii) ආහාර දීමනාව;
(iii) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක්;
(විවාහක නිලධාරීන්ට පමණක්)
(iv) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

(ආ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

(i) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්;
(ii) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී;
(iii) නිල ඇඳුම් දීමනා;
(iv) විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය;
(v) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා යාමට සහ ඒමට මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

9. ශ්‍රී ලංකා යුද, නාවික සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මඟින් පාලනය වනු ඇත.

(අ) යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය;
(ආ) යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළකරනු ලබන වලංගු රෙගුලාසි;
(ඇ) ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළකරන වලංගු යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය.

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන් /නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සූරියවැව, දක්ෂිණ මණ්ඩපයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතීන් විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12 පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන්, ඔවුන් සඳහා වෙන්කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සූරියවැව, දක්ෂිණ මණ්ඩපයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13 *භාෂා අවශ්‍යතා.* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේ දී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.*-අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. *අයදුම්පත්.*—මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේ දී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් දහසක (රු. 1,000) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුවේ "මොරටුව – ඉඩම" ශාඛාවේ අංක "9405831" ගිණුමට බැරකර, ඔබ වෙත ලැබෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේ දී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 2014 අගෝස්තු මස 31 වැනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''ලේඛකාධිකාරි, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන විෂය ධාරාව සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීන්ගේ/ නිලධාරිනියන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතු ය.

19. උප්පැන්න සහතිකය, අ. පො. ස. (සා./පෙළ), අ. පො. ස. (උ./පෙළ) විභාග සඳහා ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට (Yes) නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් යන ලේඛනවල පිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින්

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

21. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

23. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක
විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

08-797

---

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුර සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාර මි. මී. 297 x මි. මී. 210 (A4) කඩදාසි වල පිළියෙල කරගත් අයදුම්පත් 2014.09.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 02, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 34 දරන ස්ථානයේ සුරාබදු කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සුරාබදු පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය මෙම නිවේදනයේ ප්‍රකාර සෑම ආකාරයෙන්ම සම්පූර්ණ හා නිවැරදි විය යුතු අතර, එසේ නොවන හෝ නියමිත දිනට නොලැබෙන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් හෝ ඒ සම්බන්ධ ලිපි හෝ තැපෑලේදී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
විවෘත තරග විභාගයක් හා පෞද්ගලික දක්ෂතා කෙරෙහි නිසි සැලකිල්ල දැක්වෙන සම්මුඛ පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගනු ලැබේ. සුදුසුකම් ඇත්තේ පවත්නා පුරප්පාඩු ගණනට සමාන හෝ ඊට අඩු අපේක්ෂකයන් සංඛ්‍යාවක් පමණක් බව තහවුරු වුවහොත් ලිඛිත පරීක්ෂණයක් නොපවත්වා ඔවුන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවිය හැකිය.

02. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව ලිඛිත පරීක්ෂණයේදී 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතාවය මත පත්වීම් දීම සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :*

අදාල ආඥාපනත් හා වෙනත් නියෝග යටතේ නීත්‍යානුකූල සුරා ප්‍රමිති කිරීම හා අනවසර සුරා/මත්ද්‍රව්‍ය වැලැක්වීමේ ක්‍රියාවලිය සඳහා කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම හා අධීක්ෂණය සහ එම ක්‍රියාන්විතයෙහි පෞද්ගලිකව නිරත වීම. එනම් යම්කිසි බල ප්‍රදේශයක හෝ විශේෂ ඒකකයක හෝ සුරාබදු ස්ථානයක අදාල කාර්යයන් ඉටු කිරීම හා සුරා අපරාධ ග්‍රහන නිවාරන කටයුතු තමන් විසින් ක්‍රියාත්මක කිරීම හා එම කාර්යයන් සඳහා කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම.

04. *වැටුප් පරිමාණය :*
රු. 15,850- 7 x 180 - 2 x240 - 8 x 320 - 17 x 375- රු. 26,525 (11 පියවර) ක මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා. ප. ච. 6/2006 (iv) ට අනුව RS-2-2006A)

05. *වයස් සීමාව :*

අයදුම්කරුවන් 2014.09.22 දිනට වයස 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. සුරාබදු දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ට අනිකුත් සුදුසුකම් තිබේ නම්, උපරිම වයස් සීමාව නොසලකා බාහිර අපේක්ෂකයන් ලෙස ඉල්ලුම් කළ හැකිවේ.

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය;
(ii) ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය;
(iii) පාවහන් නොමැතිව අවම වශයෙන් උස සෙ. මී. 167.6 (අඩි 5 අඟල් 06ක්) විය යුතු අතර, පපුවේ මිනුම් ආශ්වාස නොකර සෙ. මී. 83.8 (අඟල් 33ක්) විය යුතුය;
(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;
(v) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා හොඳ ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය;
(vi) උපැස් යුවලක් හෝ ස්පර්ශ කන්නාඩියක් (කන්ටැක් ලෙන්සස්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය;
(vii) ක්‍රීඩා කුසලතා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

07. *ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :*

පොදු ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02, ලකුණු 100)

ඉල්ලුම්කරුගේ බුද්ධිය, තර්කනය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ගණිත/චිත්‍ර ගැටළු, සමාන/විරුද්ධ

පද ලිවීම, වාක්‍යාංශ/වාක්‍ය සෑදීම, හිස්තැන් පිරවීම පිළිබඳ ප්‍රශ්න ද ඊට ඇතුලත් වෙනවා ඇත.)

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ද පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

*ක්‍රීඩා කුසලතා*

විවිධාකාරයේ ක්‍රීඩා සම්බන්ධයෙන් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා පාසල් තරගවලදී දක්වන ලද වාර්තාගත දස්කම් සඳහා.

*විශේෂිත පුහුණු*
ශිෂ්‍යභට/ස්වේච්චා සේවය/ආත්මාරක්ෂක පුහුණු සටන් ක්‍රම හෝ තාක්ෂණ පුහුණුව
වෙනත් බාහිර ක්‍රියාකාරකම්

09. *විභාග ගාස්තු :*

අයදුම්කරුවන් රු. 1,000 ක විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එම මුදල සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 0007041628 දරන ගිණුමට බැර වෙන පරිදි ඕනෑම බැංකු ශාඛාවකින් ලබාගත් බැංකු අණකරයක් අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය. අණකරයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

10. *පුහුණු කාලය :*

තෝරාගනු ලබන අපේක්ෂකයින්ට මාස 03ක පුහුණුවක් ලබාදෙනු ලැබේ. මෙම කාල සීමාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. එකී පරීක්ෂණය සමත් නොවූයේ අදාල ආධුනිකයාගේ විෂය සීමාව ඉක්මවා ඇති කරුණු නිසා බව තහවුරු වුවහොත් පුහුණු කාලය (03) තුන් මසකින් දීර්ඝ කර ඔහුට නැවත පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදිය හැක. පුහුණු කාලය තුළදී පුහුණු වන්නන්ට රු. 3,000 ක මාසික ඒකාබද්ධ දීමනාවක් ගෙවනු ලැබේ.

11. *පරිවාස කාලය :*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු පරීක්ෂක තනතුරුවලට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේදී ඔවුන් විසින් සමත් විය යුතු යැයි නියම කරනු ලබන දෙපාර්තමේන්තු විභාග සමත් වුවහොත් අදාල තනතුරේ ස්ථිර කරනු ලැබේ. විභාග සමත් නොවීම නිලධාරියාගේ විෂය සීමා ඉක්මවා ඇති කරුණු මත සිදුවී ඇති බව තහවුරු වුවහොත් ඔහුගේ හැසිරීම, සේවය හා පැමිණීම සෑම අතින්ම සතුටුදායක වන්නේ නම් එකී විභාගය සමත්වීම සඳහා ඔහුගේ පරිවාස කාලය උපරිම වශයෙන් වර්ෂ දෙකක් පමණක් දක්වා දීර්ඝ කල හැකිය.

12 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය;

(ii) දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට නියම කල හැකිය.

13. *සේවා කොන්දේසි :*

(i) රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින්වර පනවනු ලබන සියළුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ.

(iii) ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේදැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

ඩී. ජී. එම්. වී. හපුආරච්චි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2014 අගෝස්තු මස 06 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

ආදර්ශ අයදුම්පත්‍රය

*සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) සම්පූර්ණ නම (මව් බසින්) :—————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :—————.
(කැපිටල් අකුරු භාවිතා කරන්න.)
(iii) මුල'කුරු සමඟ නම :—————.

02. (i) ස්ථිර පදිංචි ලිපිනය :—————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
(iii) ග්‍රාම සේවක කොට්ඨාසය :—————.
(iv) පොලිස් ස්ථානය :—————.
(v) ආසන්නතම සුරාබදු ස්ථානය :—————.
(vi) තැපැල් ලිපිනය :—————.
(විභාග ප්‍රවේශපත්‍ර එවීම සඳහා)
(vii) දුරකථන අංකය :—————.

03. උපන් දිනය :—————.
2014.09.22 දිනට වයස : අවුරුදු :—————. මාස :————. දින :————.

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :—————.
(පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න.)

05. ජාතිය :—————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

07. විවාහකද/අවිවාහකද යන වග :—————.

08. අධ්‍යාපන සුදුසුකම්

I.

| *උපාධියේ නම හා වර්ෂය* | *විශ්ව විද්‍යාලය* | *විෂයයන්* | *සමත් වූ පන්තිය* |
|---|---|---|---|
| | | | |

II. අ. පො. ස. (සා. පෙ.) විභාගයේ සාමාර්ථයන් ඃ

| *ගණිතය/ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාර්ථය* | *විභාග අංකය හා වර්ෂය* |
|---|---|
| | |

09. දැනට රැකියාවක් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

10. ක්‍රීඩා සහතික හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර :————.

11. වෙනත් විශේෂ පුහුණුවීම් පිළිබඳ විස්තර/ස්වේච්ඡා හමුදා සේවා ඇත්නම් එහි විස්තර. :————.

12. (i) උස ඃ සෙ. මී. (අඩි :————. අඟල් :————.)
(ii) පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ. මී. :————.
(අඟල් :————.)

13. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර. :————.

14. මුදල් ගෙවූ බැංකුවේ නම :————. බැංකු අණකරයේ අංකය :————.

බැංකු අණකරය නොගැලවෙන සේ මෙහි අලවන්න.

15. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-763/1

---

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුරු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාර මි. මී. 297 x මි. මී. 210 (A4) කඩදාසි වල පිළියෙළ කරගත් අයදුම්පත් 2014.09.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 02, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 34 දරන ස්ථානයේ සුරාබදු කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය මෙම නිවේදනයේ ප්‍රකාර සෑම ආකාරයෙන්ම සම්පූර්ණ හා නිවැරදි විය යුතු අතර, එසේ නොවන හෝ නියමිත දිනට නොලැබෙන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් හෝ ඒ සම්බන්ධ ලිපි හෝ තැපෑලේදී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය ඃ*
මූලික සුදුසුකම් ලත් අය තරග විභාගයකට සහ ඉන් සමත් වන අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට ලකුණු දීමෙන් අනතුරුව බඳවාගනු ලැබේ.

02. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය ඃ*

පවරනු ලබන බල ප්‍රදේශයක් තුළ ක්ෂේත්‍ර කටයුතු කරමින් සුරා අපරාධ වලට අදාල තොරතුරු සොයා වාර්තා කිරීම ඇතුලු එවැනි වැටලීම් වලට සහය වී අදාල අධිකරණ කටයුතු වලට සහය ලබාදීම කල යුතුව ඇත. මීට අමතරව උපසේවා රාජකාරි ඇතුළු සුරා අපරාධ/කාර්මික වාර්තා, ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමද ඔවුන් වෙත පැවරී ඇති විශේෂ රාජකාරි වේ.

03. *වැටුප් පරිමාණය ඃ*
රු. 14,280- 7 x 145 - 10 x180 - 17 x 240 - රු. 21,175 ක මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා. ප. ච. 6/2006 (iv) ට අනුව RS-1-2006A)

04. *වයස් සීමාව ඃ*

අයදුම්කරුවන් 2014.09.22 දිනට වයස අවු. 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. දැනටමත් රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ*

(i) සිංහල/දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හයකින් (06කින්) එක් වරකදී අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම;
(ii) සුරාබදු නියාමකයින් සඳහා පාවහන් නොමැතිව අවම වශයෙන් උස සෙ. මී. 162.5 (අඩි 5 අඟල් 04ක් ) ක් විය යුතු අතර, පපුවේ මිණුම ආශ්වාස නොකර සෙ. මී. 81.2 (අඟල් 32ක්) විය යුතුය. සුරාබදු නියාමිකාවන් සඳහා උස සෙ. මී. 157.5ක් (අඩි 5 අඟල් 02ක්) විය යුතුය;
(iii) උපැස් යුවලක් හෝ ස්පර්ශ කන්නාඩියක් (කන්ටැක් ලෙන්සස්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය;
(iv) අයදුම්කරුවන්/අයදුම්කාරියන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. අයදුම්කාරියන් අවිවාහක අය විය යුතුය. බඳවා ගන්නා නියාමකවරියන්ට පරිවාස කාලය සම්පූර්ණ කර පත්වීම ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ;
(v) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා හොඳ ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය;
(vi) ක්‍රීඩා කුසලතා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

06 ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :

බුද්ධි පරීක්ෂණය - පැය 01 (ලකුණු 100)
සාමාන්‍ය දැනීම - පැයි 01 (ලකුණු 100)

07 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ද පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

(i) ක්‍රිකට්/පාපන්දු/අත්පන්දු/මලල ක්‍රීඩා :—————.
(ii) බාලදක්ෂ/ශිෂ්‍යභට/හමුදා ස්වෙච්ඡා/පොලිස් උප සේවය :——————.
(iii) ආත්මාරක්ෂක සටන් ක්‍රම :—————.
(iv) නායකත්වය :—————.
(v) බාහිර ක්‍රියාකාරකම්/පෞරුෂත්වය :—————.

08. *විභාග ගාස්තු :*

අයදුම්කරුවන් රු. 500 ක විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එම මුදල සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 0007041628 දරන ගිණුමට බැර වෙන පරිදි ඕනෑම බැංකු ශාඛාවකින් ලබාගත් බැංකු අණකරයක් අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය. අණකරයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

09. *පුහුණු කාලය :*

තෝරාගනු ලබන සෑම අපේක්ෂක/අපේක්ෂිකාවක්ම පළමුව අභ්‍යාසලාභී සුරාබදු නියාමකයින්/නියාමිකාවන් වශයෙන් පත්කරනු ලබන අතර සුරාබදු නියාමක/නියාමිකා තනතුරට පත් කිරීම සඳහා අවම වශයෙන් මාස 06ක අභ්‍යාසයක් ලබා ඉන් අනතුරුව නියමිත පරීක්ෂණ වලින් සමත් විය යුතුය.

10. *පරිවාස කාලය :*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුරුවලට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේදී ඔවුන් විසින් සමත් විය යුතු යැයි නියම කරනු ලබන දෙපාර්තමේන්තු විභාග සමත් වුවහොත් අදාල තනතුරේ ස්ථිර කරනු ලැබේ.

11. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය;

(ii) දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට නියම කල හැකිය.

12. *සේවා කොන්දේසි :*

(i) රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින්වර පනවනු ලබන සියළුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය;

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ;

(iii) ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේදැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

ඩී. ජී. එම්. වී. හපුආරච්චි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2014 අගෝස්තු මස 06 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. (i) සම්පූර්ණ නම (මව් බසින්) :—————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :—————.
(කැපිටල් අකුරු භාවිත කරන්න.)
(iii) මුල'කුරු සමඟ නම :—————.

02. (i) ස්ථිර පදිංචි ලිපිනය :—————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
(iii) ග්‍රාම සේවක කොට්ඨාසය :—————.
(iv) පොලිස් ස්ථානය :—————.
(v) ආසන්නතම සුරාබදු ස්ථානය :—————.
(vi) තැපැල් ලිපිනය :—————.
(විභාග ප්‍රවේශපත්‍ර එවීම සඳහා)
(vii) දුරකථන අංකය :—————.

03. උපන් දිනය :—————.
2014.09.22 දිනට වයස : අවුරුදු :—————. මාස :————.
දින :————.

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :—————.
(පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න.)

05. ජාතිය :—————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

07. විවාහකද/අවිවාහකද යන වග :—————.

08. අධ්‍යාපන සුදුසුකම්

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සාමාර්ථයන්

| *වර්ෂය :—————. විභාග අංකය :—————.* | |
|---|---|
| *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

09. පාඨශාලාවෙන් අස්වූ පසු කරන ලද රැකියා/හදාරන ලද පුහුණු පාඨමාලා

| රැකියාවේ හෝ පාඨමාලාවේ නම | කාලය සිට - දක්වා | ආයතනය | රැකියාවක් නම් අස්වීමට හේතු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. ක්‍රීඩා සහතික හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර :————.

11. වෙනත් විශේෂ පුහුණුවීම් පිළිබඳ විස්තර/ස්වේච්ඡා හමුදා සේවා ඇත්නම් එහි විස්තර. :————.

12. (i) උස ඃ සෙ. මී. (අඩි :————. අඟල් :————.)
(ii) පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ. මී. :————.
(අඟල් :————.)

13. සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර. :————.

14. මුදල් ගෙවූ බැංකුවේ නම :————. බැංකු අණකරයේ අංකය :————.

| |
|---|
| බැංකු අණකරය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

15. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-763/2

---

## රජයේ භාෂා පරිවර්තක සේවයේ I වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

1.0 භාෂා පරිවර්තක සේවයේ I වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 මෙම නිවේදනයේ, "සේවය'' යන පදයෙන් ඒකාබද්ධ සේවයේ භාෂා පරිවර්තක සේවය අදහස් කෙරේ.

1.2 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ඒකාබද්ද සේවා අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගයේ ප්‍රතිඵල මත පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට, පත්වීම් බලධරයාට බලය ඇත. ජාතික අවශ්‍යතාව මත ඒ ඒ මාධ්‍යයන්ගෙන් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

2.0 පහත සඳහන් මාධ්‍ය සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ.

(i) සිංහල/දෙමළ - දෙමළ/සිංහල
(ii) සිංහල/ඉංග්‍රීසි - ඉංග්‍රීසි/සිංහල
(iii) දෙමළ/ඉංග්‍රීසි - ඉංග්‍රීසි/දෙමළ

3.0 ව්‍යුහය හා වැටුප් පරිමාණය :

2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) අනුව භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ වැටුප් කේත අංකය MN 6-2006 A වන අතර, භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ මාසික වැටුප් පරිමාණය රු. 21,245- 10 x 365 -15 x 450 රු 31,645 වන්නේය. පළමුවන කාර්යක්ෂමතා කඩඉම, 4 වන වැටුප් පියවරට පෙර සමත් විය යුතුය.

(අවුරුදු 45 සම්පූර්ණ වීම මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

(2001.09.12 දිනැති රාජය පරිපාලන චක්‍රලේඛ 20/2001 අනුව)

4.0 සේවා කොන්දේසි :

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රනරජයේ අංක 829/7 සහ 1994.07.26 වැනි දින දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියට පත්කරනු ලැබේ.

5.0 තෝරාගත් අපේක්ෂකයන් වැඩ බාර ගැනීමට නියමිත දිනට පෙර රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට අපේක්ෂකයා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තයයි සහතික කරනු නොලැබුවහොත් මෙම පත්වීම ක්‍රියාත්මක නොවනු ඇත.

6.0 සුදුසුකම් :

(i) ශ්‍රී ලංකා පුරවැසියකු වීම

(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී පළමුවන භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; සහ

අපො.ස. (සා.පෙළ) විභාගයේ දී හෝ ඊට සමාන විභාගයකදී දෙවන භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ දෙවන භාෂාව පිළිබඳ පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම;

සහ

(iii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටින හෝ ;
(ආ) නීතිඥ විභාගය සමත් වී සිටින හෝ ;
(ඇ) පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ බහු තාක්ෂණික ආයතනයක වාණිජ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා සිටින හෝ ;
(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා උසස් සහතිකය ලබා සිටින හෝ ;
(ඉ) මොරටුව විශ්ව විද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

1 සටහන : ඉහත උපාධි හෝ සහතික, ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනක සිට වලංගු වන්නක් විය යුතු වේ.

(iv) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය ඇති මාසයට පූර්වාසන්න වූ මාසයේ අවසාන දිනය වන දිනට එනම්, 2014.08.31 දිනට අවුරුදු 21ට එළඹ ඇති හා 40ට එළඹ නොමැති පුද්ගලයෙකුට (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත වයස් සීමාව බලනොපානු ඇත.) විවෘත තරග විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇත.

2 සටහන : සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා විෂයයන්ගෙන් 2ක් උපාධියේ දී සමත් වී ඇති විට එවැනි සුදුසුකම් ලත් අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා වැටුප් පියවර දෙකක් ඉහළින් තබනු ඇත.

7.0 *විභාග ගාස්තු* .— විභාගය සඳහා වූ ගාස්තු රු. 500/- කි. මෙම මුදල ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන සේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට ගෙවා, අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයෙහි අදාළ කොටුවෙහි නොගැලවෙන සේ එහි දාරයක් අලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

8.0 ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින්, ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය. අංක 01 සිට අංක 07 දක්වා ඉල්ලුම්පත් කඩදාසියේ පළමුවැනි පිටුවේ ද, අංක 08 සිට අංක 11 දක්වා එහි අනික් පිටුවේ ද, අංක 12 සිට අංක 13 දක්වා තුන්වෙනි පිටුවේ ද, වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් සකස් කළ යුතුය.

(ඇ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360/-කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඈ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2014 සැප්තැම්බර් 22 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස, "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "රජයේ භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)" යන්න පැහැදිලි ලෙස ලිවිය යුතුය.

(ඉ) දැනට රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත අපේක්ෂකයන් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මඟින් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. යම් කිසි අපේක්ෂකයෙක් එසේ කිරීමට අපොහොසත් වේ නම් ඔහු නුසුදුස්සකු ලෙස සළකනු ලැබේ. 2014 සැප්තැම්බර් 22 වැනි දිනට හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස් ජනරාල්ට ලැබෙන පරිදි යැවීමට හැකිවන අයුරු කල් ඇතිව ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(ඊ) සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පතක් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) "ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නියමිත පරිදි ඉල්ලුම්පත් එවන ලද අපේක්ෂකයන් වෙත විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. එම නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් එහි සඳහන් ආකාරයට අයදුම්කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම ද සුදුසු වේ. එසේ. විමසීමේදී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළග තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත."

9.0 විභාගයට ඇතුළත් වීම

(අ) මෙහි දැක්වෙන සුදුසුකම් සපුරා ඇති අයවලුන් පමණක් අයදුම් කරනු ඇතැයි යන උපකල්පනය මත ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂයකු ඔහුගේ/ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන

අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට, අදාළ ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ දී පෙනී සිටින දින, විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු රීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

සටහන : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12.0 විභාග ක්‍රමය .— ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය යන කොටස් දෙකකින් යුක්තය.

12.1 ලිඛිත විභාගය : පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍ර

(1) පරිවර්තනය - ලකුණු 100 - පැය 3 ක ප්‍රශ්න පත්‍රයක්,
(2) ඉංග්‍රීසි භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයක්,
(3) සිංහල භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයක්,
(4) දෙමළ භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයක්,
(5) අවබෝධය - ලකුණු 100 - පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයක්,

12.1.1 විෂයය නිර්දේශය :

(1) පරිවර්තනය - කාර්යාලයීය ලියවිල්ලක් හෝ වාර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උද්ධෘතයන් ඇතුළු කාර්යාලයීය, විද්‍යාත්මක, නෛතික හා තාක්ෂණික ලියකියවිලිවලින් ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින් ද උපුටාගත් දුෂ්කර පාඨ කිහිපයක් පහත දැක්වෙන ආකාරවලින් එනම් (i) හෝ (ii) හෝ (iii) හෝ යන එක් ආකාරයකින් පරිවර්තනය කිරීම.

(i) සිංහලෙන් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහලට,
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලට,
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් දෙමළ බසට. (පරිවර්තනයේදී ඉතා උසස් කුසලතාවක් අපේක්ෂිතය)

සටහන : ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍ර - මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර, ඉන් අදාළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය.

(2) ඉංග්‍රීසි භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම. වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.
(3) සිංහල භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.
(4) දෙමළ භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම

(5) අවබෝධය - සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පිළියෙළ කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයන් ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැළපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදිය.

*සැ.යු.* - අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයකුගේ සුදුසුකම් අවලංගු කළ හැක.

12.1.2. සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගන්නා අපේක්ෂකයන් අතරින් එම ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු අනුව පත්වීම් ලබාදෙනු ඇත.

12.2. සම්මුඛ පරීක්ෂණය - සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ සුදුසුකම්, සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි. මේ සඳහා ලකුණු දෙනු නොලැබේ.

13.0 සියලුම අයදුම්කරුවන් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලා තේරුම් ගත යුතුය. අදාළ සංකේත නිවැරදිව සඳහන් කළ යුතු අතර, ප්‍රමාද දෝෂ හා වැරදීම් නිවැරදි කිරීම සඳහා කරනු ලබන කිසිම අභියාචනයක් සලකා බලනු නොලැබේ. අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

13.1 විභාග ප්‍රතිඵල :

*ගැසට් නිවේදනයේ* 12.1.2. ඡේදය අනුව සුදුසුකම් සපුරාලනු ලබන අපේක්ෂකයන්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ

ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන ලබාදීම හෝ *www.results.exams.gov.lk* වෙබ් අඩවියේ පළ කිරීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ඇත.

14.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)**

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO CLASS I OF THE GOVERNMENT TRANSLATORS' SERVICE - 2013 (2014)

☐ (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි).

01. ඔබ තරග කරන්නේ භාෂා පරිවර්තක සේවයේ කුමන තනතුරක් සඳහා ද යන්න මෙහි පහතින් සඳහන් කරන්න.

(I) සිංහල/දෙමළ භාෂා පරිවර්තක 1
(II) සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තක 2
(III) දෙමළ/ඉංග්‍රීසි භාෂා පරිවර්තක 3 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල/දෙමළ - 1
සිංහල/ඉංග්‍රීසි - 2
දෙමළ/ඉංග්‍රීසි - 3 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. (i) මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ :
GUNAWARDHANA, M. G. B. S. K.

(ii) සම්පූර්ණ නම (i) ඉංග්‍රීසියෙන් :————.

(ii) සිංහලෙන්/දෙමළෙන් :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

(iii) රාජකාරි ලිපිනය :————.

(iv) දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී 1, පුරුෂ 0 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ii) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :————.

(iii) ජන වර්ගය :

| | | | |
|---|---|---|---|
| සිංහල | 1 | මුස්ලිම් | 4 |
| ලංකා දෙමළ | 2 | වෙනත් | 5 |
| ඉන්දියානු දෙමළ | 3 | | |

☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. විවාහක/අවිවාහක භාවය :
විවාහක - 1
අවිවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. (i) උපන් දිනය : වර්ෂය ඃ ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) 2014.09.22 දිනට වයස :
අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. *ගැසට් නිවේදනයේ* 6.0 ඡේදය ප්‍රකාර මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

(අ) (i) උපාධියේ හෝ සුදුසුකම්ලත් සහතිකයේ නම :————.
(ii) එකී සහතිකය ලබාගත් ආයතනයේ නම :————.
(iii) උපාධිය හෝ සහතිකය වලංගු වන දිනය :————.
(iv) උපාධිය සමත් භාෂා මාධ්‍යය :————.
(v) උපාධියේ දී සමත් වෙනත් භාෂාවන් :
(1) ————.

(2) ————.

(ආ) (i) පළමු භාෂාවට සම්මාන සාමාර්ථය ලද අ.පො.ස. (සා/පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකම් ලද විභාගය :————.

වර්ෂය :————.

(ii) දෙවන භාෂාවට සම්මාන සමාර්ථය ලද අ.පො.ස. (සා/පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකම් ලද විභාගය :————.

වර්ෂය :————.

09. ඔබ දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ ද යන වග : ඔව්/නැත.

තනතුරේ නම :————. පත් වූ දිනය :————.

දැනට සේවයේ යෙදෙන ආයතනය :————.

10. මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

| |
|---|
| |

11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ........................................ හා ........................................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකට මම එකඟ වෙමි.

තව ද මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා තේරුම් ගන්නා ලද බවත්, සංකේත අංකවල හා සපයන ලද තොරතුරුවල වැරදීමකින් හෝ මා අතින් වෙනසක් ඇති වුවහොත් ඉන් සිදුවන පාඩුව මා විසින්ම දරාගන්නා බවත්, ඊට අදාළව අභියාචනා ඉදිරිපත් නොකරන බවත් පොරොන්දු වෙමි. ("තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.")

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

.......................... පදිංචි .................. නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත් .................. මස ............ දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.

නම හා තරාතිරම :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාව)

*සටහන* : දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියකු විසිනි.

13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්කරු මෙහි, 07, 08 සහ 09 වැනි ඡේදවල දී ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ හැසිරීම හා වැඩ සතුටුදායක වූ බවත්. අදාළ ගැසට් නිවේදනයෙහි ප්‍රකාර ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත් මෙයින් සහතික කරමි. තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය.

දිනය :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

සහතික කරන ලද නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

08 - 850

---

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ සහ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 නොවැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති රීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(ii) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති, ගැසට් නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත.

03. මෙම විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2014 සැප්තැම්බර් මස 22 වැනි දින නොඉක්මවා, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. හැඳුනුම්පත් :

විභාග ශාලාවේ දී තමන් පෙනී සිටින එක් එක් විෂයය සඳහා ශාලාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

05. *අයදුම්පත්‍රය :*

(i) "ඒ4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 07 තෙක් පළමු වන පිටුවට ද, ඉතිරිය අනෙක් පිටුවලට ද, ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. අපේක්ෂක/ අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විමසා බැලිය යුතු අතර, එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් රු.400 ක විභාග ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 200 විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතුය. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර හේතුවක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(iv) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) එක් නිලධාරියෙකුට කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම එකවර පෙනී සිටිය නොහැක.

(vi) අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයට ඇතුළත්ව සිටින නිලධාරීන්ට II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

(vii) සේවයේ II "අ" ඛණ්ඩයේ නිලධාරීන්ට මෙන්ම අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පස් වසරක සේවා කාලයක් සපුරා ඇති පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වූ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ නිලධාරීන්ට ද, II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

06. අයදුම්පත් එවා ඇති සියලුම නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීමද ප්‍රතිඵලදායී වනු ඇත.

07. ඉහත (06) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

08. තමන් කැමති වන්නේ නම්, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙන් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

09. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :*

අංක 03 යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ද, රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. *විභාග පරිපාටිය :*

(1) II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 න් සමන්විත වේ.

විෂයය අංකය (01) - කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය- (කාලය පැය 02 කි) ලකුණු 100 යි
විෂය අංකය (02) - මුදල් රෙගුලාසි
(කාලය පැය 02 කි) ලකුණු 100 යි

*කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය - (විෂය අංකය 01) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| ii. වන පරිච්ඡේදය | සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය හා පත් කිරීම |
| iii. වන පරිච්ඡේදය | ස්ථාන මාරු කිරීම් |
| iv. වන පරිච්ඡේදය | මාස්පඩි තාවකාලික තත්ත්වය, ස්ථිරත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම. |
| v. වන පරිච්ඡේදය | මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම |
| viii. වන පරිච්ඡේදය | අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| xii. වන පරිච්ඡේදය | නිවාඩු |
| xiii. වන පරිච්ඡේදය | දුම්රිය බලපත්‍ර |
| xiv. වන පරිච්ඡේදය | දිවයින ඇතුළත රාජකාරි ගමන් |
| xix. වන පරිච්ඡේදය | රජයේ නිවාස |
| xLvii. වන පරිච්ඡේදය | සාමාන්‍ය හැසිරීම හා විනය |

*මුදල් රෙගුලාසි (විෂය අංකය - 02) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(i) *I වන පරිච්ඡේදය*
වියදම් හා ආදායම් ඇස්තමේන්තු
ඒකාබද්ධ අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩ සටහන්ගත කිරීම, වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ස්වරූපය, නව යෝජනා, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ වගකීම, වියදම් ඇස්තමේන්තුවල වෙනස් කිරීම්
(මු. රෙ. 1සිට 68 දක්වා)

(ii) *III වන පරිච්ඡේදය*
මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව
ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)

(2) II වන පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්නපත්‍ර 02 න් සමන්විත වේ.

විෂය අංකය (03) - කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය - (කාලය පැය 02 කි).

ලකුණු 100 යි

විෂය අංකය (04) මුදල් රෙගුලාසි - (කාලය පැය 02 කි)
ලකුණු 100 යි.

කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය (විෂය අංකය - 03) විෂය නිර්දේශය

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේදය මත සැකසේ.

| | | |
|---|---|---|
| xv වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම. |
| xvi වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| xxiii වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| xxiv වන පරිච්ඡේදය | - | වැටුප් ණය හා අත්තිකාරම් |
| xxv වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ |
| xxvii වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| xxviii වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි හා විධි |
| xxx වන පරිච්ඡේදය | - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| xxxiii වන පරිච්ඡේදය | - | නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග |
| xLvii වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම හා විනය |
| xLviii වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

නිලධාරීන්ගේ කාර්ය සාධන හා ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ.

*මුදල් රෙගුලාසි (විෂය අංකය - 04) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේදය මත සැකසේ.

(i) *vi වන පරිච්ඡේදය*
ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, අග්‍රිමය, හා බැංකු ගිණුම්, උප පත්‍රිකා, පොත්, මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම්

(මු. රෙ. 315 සිට 396 දක්වා)

(ii) *xiii වන පරිච්ඡේදය*
සැපයුම්. වැඩ හා සේවා
ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු, සැපයුම්, භාණ්ඩවල භාරය සහ හරි වැරදි බැලීම, වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ

(මු. රෙ. 685 සිට 775 දක්වා)

11. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 08 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ සහ II වන පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014**

Efficiency Bar Examination Prescribed for Officers in Segment "B" and segment "A" of class II of the Sri Lanka Technological Service - 2014

("ආ" ඛණ්ඩය සහ "අ" ඛණ්ඩය සඳහා එකවර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැක)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන විභාගය
II 'ආ' - 0
II 'අ' - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : GUNAWARDHANA, M. G. B. S. K.
(ආ) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ඇ) මුල'කුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. රාජකාරී ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. දුරකථන අංකය :

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ/II වන පන්තියේ "අ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉදිරිපත් වන විෂයන් (අදාළ නොවන වචන කපා හරින්න)

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ————. | |
| ————. | |

7. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයට ද යන වග (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(රාජ්‍ය සේවය - 10 /බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/උතුරු පළාත් රාජ්‍ය සේවය - 04/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05/වයඹ පළාත් රාජ්‍ය සේවය- 06/ උතුරුමැද පළාත් රාජ්‍ය සේවය - 07/ඌව පළාත් රාජ්‍ය සේවය - 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය - 09)

08. (i) උපන් දිනය: වර්ෂය මාසය දිනය

(ii) 2014.09.22 දිනට වයස අවු : මාස දින

09. (i) පදවි නාමය :————.
(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පන්තිය හා ශ්‍රේණිය :————.

................. (II අ/II ආ වශයෙන් ඇතුළත් විය යුතුය.)

(iii) 2014.09.22 වන දිනට එම ශ්‍රේණියේ සේවා කාලය :————.

10. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.

මුදල් ගෙවූ ලදුපත මෙහි අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට ද යටත් බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන*- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ....................... මහතා/ මහත්මිය/ මෙනෙවිය ............. දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 10 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය

දිනය :————.

08-820

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.